## 2024 මාර්තු මස වන 12 දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු වාර්තාව

පැමිණීම :- පැමිණීමේ ලේඛනයේ සඳහන් පරිදි වේ.

2024 මාර්තු මස 12 වන දින පෙ.ව.09.00ට දිස්ත්‍රික් ලේකම් එච්.පී.සුමණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේදී රැස්වීම ආරම්භ කළ අතර , එතුමා විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගන්නා ලදි.

**02.** පසුගිය වාර්තාව සමාලෝචනය

*ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 37වන ආසියා පැසිපික් සමුළුවට සමගාමීව බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානයේ පැවැත්වූ ප්‍රදර්ශනය සඳහා සහයෝගය දැක්වූ සියළු දෙනාට, සිය ස්තුතිය දිස්ත්‍රික් ලේකම්තුමා විසින් පුද කරනලදි.

| අනු අංකය | විෂය ක්ෂේත්‍රය | කාරණය | තීරණ /ප්‍රගතිය | වගකීම |
|---|---|---|---|---|
| 03. | 3.1පොහොර බෙදාහැරීමේ වැඩසටහන 2024 යල කන්නය | පොහොර ලැබීම හා නිකුත් කිරීම් | 2024 යල කන්නය සඳහා පොහොර සම්බන්ධීකරණ කමිටුව පැවැත්වූ බවත්,2024 යල කන්නයේ වී වගාව සඳහා ඉලක්කය හෙක්ටයාර 36773කි. ඉලක්කය සම්පූර්ණ කිරීමට යූරියා මෙ.ටො.8214ක්, ටී.එස්.පී. මෙ.ටො 1998ක් හා එම්.ඕ.පී.2194ක් අවශ්‍යා බව සඳහන් කරන ලදි. එම පොහොර අවශ්‍යතාවය සැපයීමට රජයේ හා පෞද්ගලික පොහොර සමාගම් 11ක් ලිඛිතව දැනුම් දී ඇති බවත්, වැඩිපුර යූරියා මෙ.ටො 8202 ක් හා එම්.ඕ.පී. මෙ.ටො 3063ක් සැපයීමට එකඟතාවය පළ කර ඇති බවද සඳහන් කරන ලදි. හෙක්ටයාරයකට රුපියල් 15,000.00ක මුදල් සහනාධාරය 2024 යල කන්නයේද ලබා දීමට නියමිත බව සඳහන් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ පොහොර |
| | 3.2 රජයේ පොහොර සමාගම් වල කටයුතු | ලංකා පොහොර සමාගම | 2024 යල කන්නයේ පොහොර නිකුත් කිරීම සම්බන්ධව තවමත් සැලැස්මක් ලැබී නොමැති අතර පොහොර නිකුත් කිරීමේ කටයුතු සූදානම් කොට ඇත. යූරියා මෙ.ටො.4783ක් , එම්ඕ.පී. මෙ.ටො.13027ක තොග පවතින බව සඳහන් කරන ලදි. | දිස්ත්‍රික් අලෙවි නිලධාරී ලංකා පොහොර සමාගම |
| | | කොමර්ෂල් පොහොර සමාගම | සමාගමෙහි දැනට ටී.එස්.පී. පොහොර නොමැත. එස්.එස්.පී. ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇත. අවශ්‍ය එස්.එස්.පී ගොවිජන සේවා මධ්‍යස්ථාන හා අලෙවි නියෝජිතවරු මඟින් ලබා දීමට කටයුතු කොට ඇත. | දිස්ත්‍රික් අලෙවි නිලධාරී කොමර්ෂල් පොහොර |
| 04. | තරුණ කෘෂි ව්‍යාවසායකත්ව ගම්මාන පිහිටුවීම | බටඅත කෘෂි තාක්ෂණික ප්‍රදර්ශනය | ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 37වන ආසියා පැසිපික් සමුළුවට සමගාමීව බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානයේ පැවැත්වූ ප්‍රදර්ශනය සඳහා සහයෝගය දැක්වූ සියළු දෙනාට ස්තුතිය පළ කරන ලදි. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට. |
| | | ව්‍යාපෘති වාර්තා සැකසීම | 2024 වර්ෂයට නව ගම්මාන 18ක මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට නියමිත අතර ප්‍රාදේශීය කාර්යාල හරහා නව ව්‍යාපෘති මේ වනවිට ලැබෙමින් පවතින බවත් සඳහන් කරන ලදි. බොහෝ ව්‍යාපෘති වල අඩුපාඩු පවතින බවත්, එම ව්‍යාපෘති වල අඩුපාඩු සකස් කර මුදල් ප්‍රතිපාදන අනුමත කරගත හැකි මට්ටමේ ව්‍යාපෘති සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු සිදු කරන බව සඳහන් කරන ලදි. කඩිනමින් ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ කටයුතු සිදු කරන මෙන් දැනුම් දෙන ලදි. | |
| | | මුං වගා කිරීමේ ව්‍යාපෘතිය | මෙතෙක් මුංඇට වගා නොකරන ලද හා මුං ඇට වගා කිරීම සඳහා ප්‍රතිලාභ ලබානොදුන් අඩු ආදායම්ලාභීන් සඳහා මුං ඇට ලබා දීමට ඉල්ලීම් කොට ඇත. | |
| | | ශාකාශ්‍රිත එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය | එක් ප්‍රතිලාභී පවුලක් සඳහා එළුවන් 03දෙනෙකු (ගැහැණු සතුන් 02 හා පිරිමි සතෙකු හෝ ගැහැණු සතුන් 03 දෙනෙකු ) ලෙස ප්‍රතිලාභී පවුලක් සඳහා රුපියල් 85,000.00ක මුදලක් වෙන් වී ඇත. සමස්ත පවුල් 300කට පමණ එළුවන් ලබා දීමට හැකියාව ඇත. ප්‍රාදේශීය ලේකම් මට්ටමින් සුදුසු ප්‍රතිලාභීන් තෝරා කඩිනමින් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කරන ලෙස දැනුම් දෙන ලදි. අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතට ලබා දීමට කටයුතු | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට. |

| | | | | |
|---|---|---|---|---|
| | | | යොදා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය එළවන් එම ප්‍රදේශයෙන්ම සොයා ගැනීමෙන් අනතුරුව ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 05. | SAPP කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ව්‍යවසායකත්ව ව්‍යාපෘතියේ ප්‍රගතිය | ප්‍රගතිය | 2024 වර්ෂයේද බඩඉරිඟු වගා ව්‍යාපෘතියේ බීජ හා පොහොර සඳහා ගෙවීම් කටයුතු සිදු කළ හැකි බව දැනුම් දී ඇති බව සඳහන් කරන ලදී. බීජ සඳහා අක්කරයකට රුපියල් 15000.00ක් සහ බිම් සකස්කිරීමට අක්කරයකට රුපියල් 5000.00ක් ලෙස ලබා දීමට නියමිත බවද සඳහන් කරන ලදී. කෘෂිකර්ම උපදේශකවරු හරහා අදාළ තොරතුරු කඩිනමින් ලබා දීමට කටයුතු කරන මෙන් දැනුවත් කරන ලදී. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ හම්බන්තොට |
| 06. | 2023/24 මහ කන්නයේ ඉලක්ක සහ ප්‍රගතිය<br><br>6.1. අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වී වගාව | වී වගාවේ ඉලක්කය හෙක්ටයාර් 14779.4කි.මේ මස ප්‍රගතිය හෙක්ටයාර් 14488.2 කි. 2023/24 මහ කන්නයේ වී අස්වනු නෙලමින් පවතියි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර්පළාත්) |
| | | බඩඉරිඟු වගාව | බඩඉරිඟු වගාවේ හෙක්ටයාර 305ක පමණ ප්‍රමාණයක් වගා කර අතර මේ වනවිට අස්වනු නෙලමින් පවතියි. | |
| | | අතිරේක බෝග වගාව | ඉලක්කය හෙක්ටයාර් 6743.9කි. මේ මස ප්‍රගතිය හෙක්ටයාර් 2074.91 කි. | |
| | | අලබෝග | ඉලක්කය හෙක්ටයාර් 85කි. මේ මස ප්‍රගතිය හෙක්ටයාර් 11.1කි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර්පළාත්) |
| | | පලතුරු වගාව | ඉලක්කය හෙක්ටයාර් 541.4කි. මේ මස ප්‍රගතිය හෙක්ටයාර් 449.05 කි. කෙසෙල් වගා වපසරිය වැඩි වී ඇත. අස්වැන්න වෙළඳපොළට සැපයීමේදී වෙළඳපොළ පළතුරු මිල ගණන් සඳහා යම් බලපෑමක් සිදු විය හැකි බව සඳහන් කරන ලදී. | |
| | | එළවළු වගාව | ඉලක්කය හෙක්ටයාර් 844.65කි. මේ මස ප්‍රගතිය 405.171 කි. | |
| | | කොළ එළවළු | ඉලක්කය හෙක්ටයාර් 51.4කි. මේ මස ප්‍රගතිය හෙක්ටයාර් 34.17 කි | |
| | | | ඒකාබද්ධ ශාක පෝෂක කළමනාකරණ වැඩසටහනට අදාළව ක්ෂේත්‍ර දින 12ත් පවත්වා ඇත.ඉදිරියේදී ක්ෂේත්‍ර දින 07ක් පැවැත්වීමට නියමිත බවද සඳහන් කරන ලදී. ඒ සඳහා ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්හට සම්බන්ධ වන ලෙස දැනුම් දෙන ලදී.<br>වල් වී වර්ග පැතිරීම අන්තර්පළාත් බල ප්‍රදේශය තුළ වැඩි වී ඇති බව නිරීක්ෂණය කළ බව සඳහන් කරන ලදී.2024 යල කන්නයේද, ව්‍යාප්ති සැලැස්මට අදාළව වල්පැළෑටි මර්ධනය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමට කටයුතු සිදු කරන බව සඳහන් කරන ලදී.<br>2024 යල කන්නයේද SAPP ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වී හෙක්ටයාර 250ක් බඩඉරිඟු වගා කිරීමට සැලසුම් කර ඇති බව සඳහන් කරන ලදී.ඒ සඳහා අවශ්‍ය ප්‍රතිලාභී නාමලේඛනය මේ වනවිට ලබා ගනිමින් පවතින බව සඳහන් කරන ලදී.<br>ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමඟ සම්බන්ධ වී කුඹුරු තුළ බෝග විවිධාංගීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව සඳහන් කරන ලදී.<br>ඒ සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු පේරාදෙණිය NRMC ආයතනය සමඟ සම්බන්ධ වී සිදු කළ බව සඳහන් කරන ලදී.<br>රතුලූණු අක්කර 0.25 ආදර්ශන 20ක් සහ සුහුරු ව්‍යාපෘතිය යටතේ රතුලූණු වගාවන්ට අවශ්‍ය බීජ ලබා දී, 2024 යල කන්නයේ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර්පළාත්) |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපේක්ෂිත බව සඳහන් කරන ලදි.<br>ඉදිරි තුන්වන කන්නය සඳහා අවශ්‍ය බීජ නිෂ්පාදන කිරීමේ වැඩසටහනට අදාළව හෙක්ටයාර 100ක වපසරියක බීජ ගොවිපලවල් පිහිටුවීම සඳහා බීජ ලබා දීමේ කටයුතු වල සම්බන්ධීකරණ කටයුතු මේ දිනවල සිදු වෙමින් පවතින බව සඳහන් කරන ලදි. | |
| | 6.2. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | වී වගාව<br><br>එළවලු වගාව<br><br>පලතුරු වගාව<br><br>අතිරේක බෝග වගාව | ඉලක්කය (හෙක්) 13273.0කි. මේ දක්වා වගාව (හෙක්) 12328කි.<br>ඉලක්කය (හෙක්) 2448.7කි. මේ දක්වා වගාව (හෙක්) 1784.0කි.<br>ඉලක්කය (හෙක්) 5583කි.<br><br>ඉලක්කය (හෙක්) 2733.2කි. මේ දක්වා වගාව (හෙක්) 2098.0කි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පළාත්) |
| | 6.3 මහවැලි අධිකාරිය (2024 යල කන්නය) | වී වගාව<br><br>එළවළු වගාව<br><br>පළතුරු වගාව | ඉලක්කය හෙක්ටයාර 7070කි.<br><br>ඉලක්කය හෙක්ටයාර 1000කි.<br><br>ඉලක්කය හෙක්ටයාර 6430කි.<br><br>2023/24 මහ කන්නයේ අස්වනු නෙලීමේ කටයුතු මේ වනවිට 95%ක පමණ අවසන් වී ඇති බව සඳහන් කරන ලදි. 2024.03.07 වන දින ව්‍යාපාර කමිටුව පැවැත්වූ අතර 2024 යල කන්නය සඳහා ජලය නිකුත් කිරීම 2024 මාර්තු මස 20වන දින සිට ආරම්භ කරන බවත්, මුර ජලය නිකුත් කිරීම අප්‍රේල් මස 11වන දින සිට ආරම්භ කර ජූලි 10වන තෙක් ජලය ලබා දීමට තීරණය වූ බව සඳහන් කරන ලදි.මේ වනවිටත් උඩවලව ජලාශය සම්පූර්ණ ධාරිතාවයේ පවතින බව දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු, ශ්‍රීලංකාමහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| | 6.4. බීජ හා රෝපණ ද්‍රව්‍ය | ප්‍රගතිය | ඉදිරි කන්නයට අවශය බීජ නිකුත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ප්‍රමාණවත් තරම් බීජ වී (බුසල් ලක්ෂයක් පමණ)පවතින බව සඳහන් කරන ලදි. බීජ මුං නිකුත් කිරීමේ කටයුතු මේ වනවිට සිදු කරගෙන යමින් පවතී. වගා කිරීමට අවශ්‍ය මුං බීජ තමන්ම නිෂ්පාදනය කරගැනීමට ගොවි ප්‍රජාව දැනුවත් කරන ලෙස යෝජනා විය.<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යෂ (ව්‍යාප්ති) හම්බන්තොට නිකුත් කළ ඇති බිත්තර වී ප්‍රමාණය බුසල් 346කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 16750කි. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ අන්තර් පළාත්, හම්බන්තොට නිකුත් කළ ඇති බිත්තර වී ප්‍රමාණය බුසල්603 කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 20350කි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නිකුත් කළ ඇති බිත්තර වී ප්‍රමාණය බුසල් 105346කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 3500කි. වලව බීජ සංගමය හුංගම නිකුත් කළ ඇති බිත්තර වී ප්‍රමාණය බුසල් 96කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 3300කි. අඹිලිපිටිය බීජ නිෂ්පාදන සමිතිය නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 39කි.අපේක්ෂිත ඉලක්කය බුසල් 1300කි. තිස්ස විවිධ සේවා සමුපාකාර සමිතිය නිකුත් කළ ඇති ප්‍රමාණය බුසල් 15කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 500කි. අරුණැල්ල ගොවි සංවිධානය නිකුත් කර ඇති බුසල් ප්‍රමාණය 16කි අපේක්ෂිත ඉලක්කය බුසල් 800කි. ශ්‍රී ශක්ති ගොවි සංවිධානය නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 22කි. අපේක්ෂිත ඉල්ක්කය බුසල් 800කි. පුද්ගලික වැඩ සටහන නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 101කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 4150කි. කොන්ත්‍රාත් වැඩ සටහන නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 112කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 3500කි. සම්පත් බිත්තර වී කල්තොට නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 23කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 700කි. එෆ්.ඒ.ඕ, නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 442කි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), බටඅත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉලක්කය බුසල් 55250කි. මීට අමතරව සාමාන්‍ය ව්‍යාපෘතිය සඳහා බීජ වී බුසල් 4198ක ප්‍රමාණයක් නිකුත් කර ඇත. ස්වයං බීජ වී නිෂ්පාදන වැඩ සටහන සඳහා කිලෝග්‍රෑම් 2 ලියාපදිංචි බීජවී පැකට් 2238ක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ පළාත් හම්බන්තොට සඳහාත්, පැකට් 4120ක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ අන්තර් පළාත් සඳහාත් නිකුත් කර ඇත. 2024 මාර්තු 11 වන දිනට අතිරේක ආහාර බෝග බීජ තොග තත්ත්වය බඩ ඉරිඟු දෙමුහුන් දෙකකි. මුං එම්.අයි 6 සහතික පංතිය කිලෝග්‍රෑම් 2500කි. කව්පි දවල සහතික පංතිය කිලෝග්‍රෑම් 12කි. කව්පි වරුණි සහතික පංතිය කිලෝග්‍රෑම් 12කි. රටකජු තිස්ස සහතික පංතිය කිලෝග්‍රෑම් 220කි.තල උමා වාණිජ පංතිය කිලෝ ග්‍රෑම් 2කි. කුරක්කන් ඕෂධ සහතික පංතිය කිලෝග්‍රෑම් 80කි. උඳු එම්.අයි 01 සහතික පංතිය කිලෝග්‍රෑම් 200කි.<br>2024 පෙබරවාරි 26 වනදිනට AT 362 අත්තිවාරම් පංතිය (බුසල්) 237කි. ලියාපදිංචිපංතිය (බුසල්) AT 362 2495කි. LD- 368 අත්තිවාරම් පංතිය (බුසල්) 37කි. LD-368 ලියාපදිංචි පංතිය (බුසල්) 93කි. Bw- 372 අත්තිවාරම් පංතිය (බුසල්) 13කි. ලියාපදිංචිපංතිය (බුසල්) 05කි. BG – 252 අත්තිවාරම් පංතිය (බුසල්) 09කි. ලියාපදිංචිපංතිය (බුසල්) 92කි. Ld- 408 අත්තිවාරම් පංතිය (බුසල්) 06කි.. | |
| 07. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වේ වැඩසටහන් | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| 08. | ඒකාබද්ධ ජල ධාරා හා ජල සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | ඒකාබද්ධ ජලධාරා කළමණාකරන ව්‍යාපෘතිය<br><br>කාලගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර ප්‍රෙව්ශය ව්‍යාපෘතිය | ව්‍යාපෘති 25න් 5ක වැඩ 50%කට වඩා අවසන්ව ඇත. තවත් ව්‍යාපෘති 12ක වැඩ ආරම්භ කර ඇත. 2024 වර්ෂයේ අප්‍රේල් මස වනවිට ව්‍යාපෘති 25හි වැඩ අවසන් කිරීමට හැකියාව පවතින බව සඳහන් කරන ලදි.<br><br>ව්‍යාපාති 6ක වැඩකටයුතු 100%ක් අවසන් වි ඇත. තවත් එක් ව්‍යාපාතියක වැඩකටයුතු 30%- 50% ප්‍රමාණයක් වැඩ කටයුතු අවසන් වී ඇත. ව්‍යාපාති 18ක වැඩකටයුතු 50%කට වඩා අඩුවෙන් අවසන් වී ඇත. සම්පූර්ණ ව්‍යාපෘති 32කි. ව්‍යාපෘති 17ක් ටෙන්ඩර් (Tender) කටයුතු සිදු කර ඇත. නමුත් මේ සඳහා ව්‍යාපෘති නිර්දේශය තවමත් ලැබී නොමැති බව සඳහන් කරන ලදි.<br>අවශ්‍ය නිර්දේශයන් ලැබෙන්නේ නම්, අමතර ඇස්තමේන්තු 100ක පමණ වැඩකටයුතු අවසන් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බව සඳහන් කරන ලදි. මීට අමතරව 2024 වර්ෂයේ පෙබරවාරි මස 13 වන දින දිවයිනට පැමිණි මෙම ව්‍යාපෘති සඳහා ආධාර ලබාදෙන ලෝක බැංකුවේ නියෝජිත කණ්ඩායම විසින්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සාර්ථකව සිදු කර ඇති බව [illegible] බවුත්, නැවත මේ වසරේ මැයි මාසයේ එම [illegible] පිරිස ලංකාවට පැමිණීමට නියමිත අතර ප්‍රතිපාදන ලබාදිය යුතු අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් එම අවස්ථාවේදී තීරණය කිරීමට නියමිත බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ, හම්බන්තොට. |
| 09. | දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ වැඩසටහන් | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය සඳහා ආරම්භ කරන ලද වැව් 42ක වැඩ අවසන් කොට ඇත. වැව් 03ක වැඩ කටයුතු අර්ධයක් නිම කර තිබු අතර අළුතින් වැව් 29ක වැඩ කටයුතු ආරම්භ කරන ලදි. එම වැව් 29ක් 90%කට වඩා ප්‍රගතිය පවතින වැව් 12කි. එයින්ද වැව් 09ක වැඩ කටයුතු 99%ක් පමණ අවසන් වී ඇත. 25% - 90% අතර වැඩ කටයුතු අවසක් වූ වැව් 12ක් පවතින බවත්, 25%ට වඩා අඩු ප්‍රගතිය පවතින වැව් 05ක් පවතින බවත් සඳහන් කරන ලදි. 2024 පෙබරවාරි මස වනවිට මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන [illegible]කි. ගිවිසුම් ගත වි පැවතියේ සියළුම | |

| | | | | |
|---|---|---|---|---|
| | | | බදු මුදල් සමඟ රුපියල් බිලියන 2294කි. මූල්‍ය ප්‍රගතිය 42%ක් බවත්, භෞතික ප්‍රගතිය 88%ක් පමණ වන බවත් සඳහන් කරන ලදි. අළුතින් වැව් 12ක්, අමුණු 01ක් , උස්සාන වාරි ව්‍යාපෘති 04ක් සඳහා ඇස්තමේන්තු සකස් කරන ලෙස පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව සඳහන් කරන ලදි.<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ වැඩසටහන් වලට අදාළව දිස්ත්‍රික් කමිටුව හෝ පළාත් කමිටුව මේ වනවිට පැවැත්වීම සම්බන්ධව කිසිදු තොරතුරක් තමන් නොදන්නා බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. මෙම ව්‍යාපෘතිය තවත් අවුරුදු එකහමාරක් දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇති බවත් එයට අදාළ ව්‍යාපෘතිද තිස්සමහාරාමය හා ලුණුගම්වෙහෙර පදේශය කේන්ද්‍ර කරගනිමින් සිදු කරන බවත් සඳහන් කරන ලදි.<br>2023/24 මහ කන්නයේ වගා කිරීමට හෙක්ටයාර 120ක් සඳහා මුංඇට බීජ, හෙක්ටයාර 44ක් සඳහා රටකජු බීජ, හෙක්ටයාර 16ක් සඳහා බඩඉරිඟු බීජ, මිරිස් හෙක්ටයාර 15ක් හා එළවළු බීජ හෙක්ටයාර 25ක් සඳහා ලබාදී ඇත.<br>කාවන්තිස්සපුර හා ජුල්පල්ලම පදේශ වල විසිරුම් ජල සම්පාදන පද්ධති 74ක් ලබා දී ඇත. බිංදු ජල සම්පාදන පද්ධති 94ක් මේ වනවිට සවි කිරීමට නියමිත බව සඳහන් කරන ලදි. සෝලා පම්ප් 20ක් බල ප්‍රදේශය තුළ සවි කර ඇති බවත්, තවත් 18ක් මේ වනවිට සවිකිරීමේ කටයුතු සිදු කරන බවත් දැනුම් දෙන ලදි.මේ වනවිට ආසන්නව ලක්ෂ 06ක පමණ මුදලකට සෝලා පම්ප් මිලදී ගැනීමේ හැකියාව පවතින බවද සඳහන් කරන ලදි. වී වගා ගොවීන්හට ඒකාන්තර තෙත් හා වියලි ක්‍රමය ලෙස නව වී වගා ක්‍රමයක්, නව ආදර්ශන 100ක් ලෙස සිදු කිරීමට බලාපොරොත්තු වන බවද සඳහන් කරන ලදි. ගෙවතු වගා සඳහා බීජ පැකට් ලබාදීමට නියමිතය. දොඩම් පැළ 400ක්, දිවුල් පැළ 250ක්, පැපොල් පැළ 500ක් හා අඹ පැළ 8000ක් ලබාදුන් බව සඳහන් කරන ලදි. විසිරි ජල සම්පාදන පද්ධති සවි කරනලද පදේශවල අධීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිළධාරින්ගේ සහයෝගය අවශ්‍ය බවත්,ඒ සඳහා සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසත් දැනුවත් කරන ලදි.<br>කාවන්තිස්සපුර හා ජුල්පල්ලම යන පදේශවල සාර්ථකව වගා කටයුතු සිදු කරන ගොවීන් පිරිසක් සිටින අතර එම ගොවීන්ගේ ඉඩම් සඳහා බලපත්‍ර නොමැති බැවින් ව්‍යාපෘතිය යටතේ අදාල උපකරණ ලබාදීමේ ප්‍රායෝගික ගැටළුවක් පවතින බව සඳහන් කරන ලදි. ඒ සම්බන්ධයෙන් අදාල වන තොරතුරු සොයාබැලීම සඳහා කටයුතු කරන මෙන් අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) විසින් දැනුම් දෙන ලදි.<br>සාදා නිම කරන ලද වැව් නැවත නඩත්තු කටයුතු සිදු කිරීමට හෝ වගකීම ගොවි සංවිධාන වෙත භාර දීමේ නිසි ක්‍රමවේදයක් පැවතිය යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br>බුන්දල සේවා පියසක් සෑදීමට යෝජිත වුවත් මේ වනවිට එය සිදු නොවන බව දැනුම් දෙන ලදි.<br>සූර්යපැනල මඟින් ක්‍රියාත්මක කෙරෙන වතුර මෝටර් සහිත අඩු වියදම් ආදර්ශනයක් බටඅත කෘෂි තාක්ෂණික ප්‍රදර්ශනයේ නිරූපණය කර තිබූ අතර එම නිෂ්පාදකයා සම්බන්ධ කරගෙන ඒ සම්බන්ධයෙන් ගොවි ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | |
| 10. | වැලිගත්ත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය | ප්‍රගතිය | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | අධ්‍යක්ෂ, වැලිගත්ත කෘෂි තාක්ෂණික හා |

| | | | | |
|---|---|---|---|---|
| | විද්‍යායතනයේ වැඩසටහන් | | | ග්‍රාමීය විද්‍යායතනය |
| **11.** | මහා වාරිමාර්ග 11.1.1 මුරුතවෙල ජලාශය | වර්තමාන ජල ධාරිතාවය | මුරුතවෙල ජලාශයේ ජල ධාරිතාවය මේ වනවිට අක්කර අඩි 38723 (99%)කි. කැකිරිඔබඩ අක්කර අඩි 2227කි එනම් ( 96%) වේ. මුරුතවෙල ව්‍යාපාරයේ අස්වනු නෙලා අවසන් බව සඳහන් කරන ලදි. 2024.03.13 වන දින 2024 යල කන්නය සඳහා කන්න රැස්වීම පැවැත්වීමට නියමිත බව සඳහන් කරන ලදි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු (වීරකැටිය) |
| | 11.1.2. කිරම ඔය | | කිරමඔය හා ඌරුබොකුඔය ව්‍යාපාර වල වගා කටයුතු ප්‍රමාද වීම හේතුවෙන්, අප්‍රේල් මස අළුත් අවුරුද්දෙන් පසුව ජලය ලබා දීමට නියමිත බව සඳහන් කරන ලදි. | |
| | 11.1.3. ඌරුබොකුඔය | | | |
| | 11.1.4. කිරිදි ඔය | ජලාශ වල වර්තමාන ජල ධාරිතාවයන් | ලුණුගම්වෙහෙර ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 171666කි. තිස්සවැව අක්කර අඩි 2500කි. යෝධවැව අක්කර අඩි 6500කි, බඳගිරිය වැව අක්කර අඩි 8950කි. වීරවිලවැව අක්කර අඩි 11225 හා දෙබරවැව අක්කර අඩි 685 ලෙස පවතින බව දැනුම් දෙන ලදී. වෙහෙරගල ජලාශයේ වර්තමාන ජල ධාරිතාවය අක්කර අඩි 54877කි. දකුණු ඉවුර සඳහා ජලය නිකුත් කිරීමේ කටයුතු සිදු කර කන්නය ආරම්භ කර ඇති බවත්, වීරවිල හා වම් ඉවුර සඳහා මාර්තු මස 15 දින සිට කන්නය ආරම්භ කරන බවත් සඳහන් කරන ලදි. 2024.03.12 දින තිස්ස වැව යටතේ කන්න රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් සඳහන් කරන ලදි. තිස්සවැව හා යෝධවැව ජලය නිකුත් කිරීමේ කටයුතු අප්‍රේල් මාසයෙන් පසුව සිදු කිරීමට අපේක්ෂා කරන බවද සඳහන් කරනලදි. මේ වනවිට නඩත්තු කටයුතු සිදු කරමින් පවතින බවද සඳහන් කරන ලදි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තිස්සමහාරාමය |
| | 11.1.5 රිදියගම | | රිදියගම ජලාශය ධාරිතාවය අක්කර අඩි 24280කි.එනම් 99%කි. ජලාශයේ ජලය ප්‍රශස්ථ මට්ටමක පවතින බැවින් 2024 යල කන්නය ජල හිඟයකින් තොරව සාර්ථකව සිදු කර ගැනිමට හැකි බව සඳහන් කරන ලදි.2023/24 මහ කන්නයේ අස්වනු නෙලීමේ කටයුතු අවසන් අදියරේ පවතින බවද සඳහන් කරන ලදි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට. |
| | 11.1.6. ලියන්ගස්තොට | | ලියන්ගස්තොට වම් ඉවුරේ 2024 යල කන්නය සඳහා කන්න රැස්වීම 2024.03.12 දින ප.ව 2.30ට පැවැත්වීමට නියමිත බවද සඳහන් කරන ලදි.<br>ලියන්ගස්තොට දකුණු ඉවුරේ අස්වනු නෙලීමේ කටයුතු අවසන් කර ඇති බවත් 2024 යල කන්නය සඳහා කන්න රැස්වීම 2024.03.14 වන දින ප.ව.2.30ට පැවැත්වීමට කටයුතු යොදා ඇති බවද සඳහන් කරන ලදි. බහුතර ගොවි ජනතාව මේ වනවිට අස්වනු නෙලීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ගොවීන් කිහිප දෙනෙක් විසින් නැවත ජලය ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් එය ප්‍රායෝගිකව ගැටළු සහගත තත්ත්වයක් බවත් සඳහන් කරන ලදි. කන්න රැස්වීම් තිරණ වලට පටහැනිව වගා කටයුතු සිදු කිරීමෙන් මෙවැනි ගැටළු ඇති වන බවද සඳහන් කරන ලදි. එමෙන්ම අතිරේක ජල මුරයක් ලබා නොදීමට ව්‍යාපාර කමිටුව තිරණය කළ බවද සඳහන් කරන ලදි. | |
| | 11.1.7. මවුආර ව්‍යාපාරය | | මවුආර ජලාශයේ ජල ධාරිතාව අක්කර අඩි 32697කි. එනම් 99%කි. මේ වනවිට අස්වනු නෙලීමේ කටයුතු සිදු කරමින් පවතින බවද සඳහන් කරනලදි. 2024 යල කන්නය සඳහා පෙර කන්න රැස්වීම පවත්වා අවසන් බවත්, කන්න රැස්වීම පැවැත්වීමට සැලසුම් කර ඇති බවද සඳහන් කරන ලදි. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට. |

| | | | | |
|---|---|---|---|---|
| 12. | වාරි කළමණාකරණ අංශ | කිරිදි ඔය කලාපය | මුංඇට බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ ගොවීන් 630කට බීජ කිලෝ 470ක්, 50% සහනාධාරය යටතේ ලබා දී ඇත. බටඅත බීජ ගොවිපලෙන් ලබාගත් එම බීජවල පැළ වීමේ ප්‍රතිශතය 98%කි. මෙමගින් ගොවීන් ස්වයං බීජ නිෂ්පාදනය සඳහා යොමු කිරිමට හැකියාව පවතින බවද සඳහන්කරනලදි.<br>ගොයම් කපන යන්ත්‍ර මඟින් ගොයම් කැපිම සඳහා වැඩි මුදලක් වැය කිරිමට සිදු වන බවත්, වියදම අඩු කර ගැනිමට නිසි වැඩපිළිවෙළක් සකස් කර දෙන ලෙස යෝජනා විය. අක්කරයට රුපියල් 20000.00ක පමණ මුදලක් අයකිරිමට සිදු වන බවත්, මිල අඩු කිරිමෙන් යන්ත්‍රයේ නඩත්තු කටයුතු සිදු කිරිමට නොහැකි බවත් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් දැනුම් දෙන ලදි. | ව්‍යාපෘති කළමණාකරු, කිරිදිඔය ව්‍යාපාර |
| | | මුරුතවෙල කලාපය | 2024 යල කන්නය සඳහා කන්න රැස්විම 2024.03.13 වන දින පැවැත්විමට නියමිත බවත්, යාය 01 හා 02 සඳහා 2024.03.15 දින සිට හා යාය 03 සඳහා 2024.03.20 දින සිට ජලය නිකුත් කිරිමේ කටයුතු සිදුකිරිමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි. 2024.04.19 වන දින අළුත් සහල් මංගල්‍යයක් පැවැත්විමට කටයුතු සංවිධානය කර ඇති බවද සඳහන් කරන ලදි. | ව්‍යාපෘති කළමණාකරු, මුරුතවෙල ව්‍යාපාරය. |
| | | රිදියගම කලාප | මේ වනවිට වී අස්වනු නෙලිමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර ගංවතුර තත්ත්වය නිසා නැවත වගා කළ කුඹුරු වල අස්වනු නෙලිමේ කටයුතු ප්‍රමාද වන බව සඳහන් කරන ලදි. 2024 යල කන්නය සඳහා කන්න රැස්විම 2024.03.12 වන දින පැවැත්විමට නියමිත බවත්, අප්‍රේල් 01 දින සිට අප්‍රේල් 25 දින තෙක් ජලය ලබා දිමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි. | ව්‍යාපෘති කළමණාකරු, රිදියගම. |
| 13. | සුළු වාරිමාර්ග 13.1 පළාත් වාරි මාර්ග | | වැව් අළුත්වැඩියාකිරිම සම්බන්ධයෙන් කොන්ත්‍රාක්කරුවන්ගේ ප්‍රගතිය අඩු මට්ටමක පවතින බවත්, අදාළ කොන්ත්‍රාක්කරුවන් ගෙන්වා සාකච්ඡාවක් පැවැත්විමට කටයුතු කිරිම සුදුසු බවත් සඳහන් කරන ලදි. අදාළ නිළධාරින් කැඳවා සාකච්ඡා කිරිමද සිදු කළ යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු |
| | 13.2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | | සුළු වාරිමාර්ග නඩත්තු කටයුතු හා දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු වෙනුවෙන් 2024 වර්ෂයට අදාළව ප්‍රතිපාදන රුපියල් මිලියන 3000ක් පමණ වෙන් වී ඇත. දැනට අදාළ ව්‍යාපෘති හඳුනා ගනිමින් ඇස්තමේන්තු සකස් කරමින් පවති. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබාගැනිම සඳහා මීළඟ දිස්ත්‍රික් කෘසිකර්ම කමිටුව වෙත අදාළ යෝජනා ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වන බව සඳහන් කරන ලදි.<br>මූල්‍ය සහනාධාර ගෙවිමේ වැඩකටයුතු මේ වනවිට අවසන් කරඇති බවත්, තවත් හෙක්ටයාර 500කට පමණ ප්‍රමාණයකට භාණ්ඩාගාරයෙන් මුදල් ලැබිය යුතුව පවතින බවද සඳහන් කරන ලදි.<br>පොහොර නිකුත් කිරිම් යූරියා මෙ.ටො.330ක් සහ එම්.ඕ.පි.ටොන් 83ක් පමණ ප්‍රමානයක් ගොවිජන සංවර්ධන සේවා මධ්‍යස්ථාන හරහා නිකුත් කිරිම් කටයුතු සිදු වූ බව සඳහන් කරන ලදි. 2024 යල කන්නය සඳහාද මූල්‍ය සහනාධාරය ලැබෙන බවට දැනුවත් කර ඇති බව සඳහන් කරන ලදි. කෘෂිකාර්මික ගොඩ ඉඩම් සිතියම් ගත කිරිමේ වැඩසටහන සඳහාද අවශ්‍ය කටයුතු සූදානම් කරගෙන පවතින බව සඳහන් කරන ලදි.<br>පොහොර මූල්‍ය සහනාධාරය ලෙස ලබාදෙන හෙක්යටයාරයට රුපියල් 15000.00ක මුදල ලබා ගත් ගොවීන් නිසි පරිදි පොහොර මිලදි ගෙන වගා භූමියට යෙදිම සම්බන්ධයෙන්,තහවුරු කරගැනිමට නිසි | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| | | | ක්‍රමවේදයක් පැවතිය යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br>2024 යල කන්නයේ සිට ඩ්‍රෝන යානා 04ක් හම්බන්තොට දිස්ත්‍රික්කය වෙත ගෙන ඒමට බලාපොරොත්තු වන අතර අගුනුකොළපැලැස්ස, වීරකැටිය, වීරවිල හා අම්බලන්තොට ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට ලබා දීමට නියමිත බවද සඳහන් කරන ලදි. වගා භූමියට කෘමිනාශක යෙදීම සඳහා භාවිතා කිරීමට හැකි බවද සඳහන් කරන ලදි.<br>වීරවිල ගොවිජන සේවා මධ්‍යස්ථානය, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය හා පුද්ගලික අංශය ඒකාබද්ධව සිදු කෙරෙන වැඩසටහන යටතේ ගොවිපල යන්ත්‍රෝපකරණ මධ්‍යස්ථානයෙහි වැඩ කටයුතු, යෝධකණ්ඩිය Machine Centre යන ආයතනය හා ඒකාබද්ධව ආරම්භ කර බව සඳහන් කරන ලදි. | |
| 14. | වී අලෙවි මණ්ඩලය | ප්‍රගතිය | මුදල් අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් වීමෝල් හිමිකරුවන් වෙත ණය මුදල් ලබා දී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අදාළ කිසිදු තොරතුරු නොලැබී ඇති බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br><br>2023/24 මහ කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති අතර නාඩු වී කිලෝ එකක් රුපියල් 105.00ක මුදලකටත්, සම්බා කිලෝ එකක් රුපියල් 120.00ක මුදලකටත් හා කිරි සම්බා කිලෝ එකක් 130.00ක මුදලකටත් මිලදී ගන්නා බව සඳහන් කරන ලදි. 14%ට වඩා අඩු තෙතමනය සහිත වී කිලෝ 2000ක්, එක් ගොවි මහතෙක්ගෙන් මිලදී ගන්නා බවත්,දැනට මුලික වශයෙන් වීරවිල, යෝධකණ්ඩිය, දෙහිගහලන්ද හා කච්චිගල්ආර යන වී ගබඩා වෙත වී මිලදී ගැනීම් සිදු කරමින් පවතින බවත් සඳහන් කරන ලදි.. වී මිලදී ගැනීමේ කටයුතු සඳහා දිගින් දිගටම මුදල් නොමැති ප්‍රශ්නය පැවති අතර 8% පොලියට ණයක් ලබාගෙන වී මිලදී ගැනීමේ කටයුතු සිදු කරගෙන යන බවද සඳහන් කරන ලදි. අනෙකුත් දිස්ත්‍රික්ක වල වී අලෙවි මන්ඩලය මගින් මිලදී ගන්නා වී මිලට වඩා වැඩි මිලකට පෞද්ගලික අංශයෙන් වී වී මිලදී ගැනීමේ කටයුතු සිදු වන නිසා, වී අලෙවි මණ්ඩලය මගින් වී මිලදී ගැනීමක් සිදු නොවන බව සඳහන් කරන ලදි.<br>2023 යල කන්නයේ වී මිලදී ගැනීමේ කටයුතු වලින් මිලියන 17ක ලාභයක් ලැබූ බවද සඳහන් කරන ලදි.<br>වී අලෙවි මණ්ඩලයට අදාළ බොහෝ තීරණ කැබිනට් මණ්ඩලය මගින් ලබා ගත් තීරණ වන බවත්, ආයතනය තුළ එක් අයෙක් හෝ දෙදෙනෙක් වංචාකිරීමේ කටයුතු සිදු කළහොත් අනෙක් ආයතනවල මෙන්ද එම අදාළ නිලධාරියාට දඬුවම් ලබා දී ආයතනයෙන් ඉවත් කිරීමේ කටයුතු සිදු කරන බවත්, ඉහළ නිලධාරින්ගේ තින්දු තිරණ නිසා වී අලෙවි මන්ඩලය පාඩු ලබන ආයතනයක් බවට පත් වී ඇති බව සඳහන් කරන ලදි.<br>වී මිලදී ගැනීමේ කටයුතු වලදී අදාළ ගොවින්ට මුදල් ගෙවීමේ කටයුතු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා සිදු කිරීමට නියමිත බව සඳහන් කරන ලදි. ඒ සඳහා | ප්‍රාදේශීය කළමනාකරු, වී අලෙවි මණ්ඩලය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවශ්‍ය සහයෝගය ලබා දීමට පෙර දැනුවත් කිරීමක්, සිදු කරන ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් දැනුම් දෙන ලදි. | |
| 15. | අපනයන කෘෂි බෝග වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | අපනයන කෘෂි බෝග නවවගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ ගම්මිරිස් හෙක් 35ක් සඳහා පැළ 59500ක්, පුවක් හෙක් 50ක් සඳහා පැළ 85000ක් ,පැගිරි හෙක් 10ක් සඳහා පැළ 280000ක්, කෝපි පැළ 8000ක්, කහබීජ කිලෝග්‍රෑම් 7500ක්, ඉඟුරු බීජ කිලෝග්‍රෑම් 6250ක් ලබා දීම ඉලක්ක කර ඇත.කුඩා පරිමාණ හා ගෙවතු වගා ප්‍රවර්ධන වැඩ සටහන යටතේ පුවක් පැළ 68000ක් ,කෝපි පැළ 3200ක්, කරාබු පැළ 3000ක්, ගොරකා පැළ 750ක්, එන්සාල් පැළ 2000ක්, සාදික්කා පැළ 750ක්, වැනිලා පැළ 11000ක් , කහ බීජ කිලෝග්‍රෑම් 7500ක් ඉඟුරු බීජ කිලෝග්‍රෑම් 6250ක් හා ගම්මිරිස් පැළ 30600ක් ලබා දීමට ඉලක්ක කර ඇත.<br>භූමි ඵලදායීතාවය ඉහල නැංවීමේ වැඩ සටහන යටතේ ගම්මිරිස් හෙක්. 17.5ක් සඳහා ගම්මිරිස් පැළ 11900ක් කෝපි පැළ 2240ක් මෙම වැඩ සටහන යටතේ ලබා දීමට ඉලක්ක කර ඇත. | සහකාර අධ්‍යක්ෂ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 16. | පොල් වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | සහනාධාර යටතේ නව/ නැවත/ යටි වගාව මගින් ක්‍රමවත් පොල් වගාව ස්ථාපිත කිරීම(පැළ) ඉලක්කය 36000ක් ප්‍රගතිය 35313කි. සහනාධාර යටතේ ගෙවතු වගා මගින් පොල් වගාව ස්ථාපිත කිරීම (පැළ) ඉලක්කය 3000කි. ප්‍රගතිය පැළ 4379කි. විවිධ පුනරුත්ථාපන ක්‍රමවේදය යටතේ පොල් ඉඩම් පුනරුත්තාපනය කිරීම (අක්කර) ඉලක්කය 83කි. ප්‍රගතිය අක්කර 6කි.. කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය ඉලක්කය අක්කර 160කි. ප්‍රගතිය අක්කර 182කි. පාළු පැළ සිටුවීම ඉලක්කය පැළ 1600කි. ප්‍රගතිය පැළ 2559කි. ව්‍යාප්ති වැඩ සටහන් ප්‍රගතිය 10කි. පුහුණු වැඩසටහන් මගින් වැඩ සටහන් ඉලක්කය 41කි. ප්‍රගතිය 29කි. පොල් සංවර්ධන නිලධාරී විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන් ඉලක්කය 37කි. ප්‍රගතිය 36කි. මයිටා පැකට් බෙදා දීම ඉලක්කය පැකට් 19100කි. ප්‍රගතිය 15408කි. තැඹිලි වගා සහනාධාරය පැළ ඉලක්කය 1400කි. ප්‍රගතිය 254කි. හම්බන්තොට දිස්ත්‍රික්කය තුල සුදු මැස්සන් හානිය ව්‍යාප්තවෙමින් පවතින අතර මේ වන විට ගස් 41349ක හානිය හඳුනාගෙන ඇති අතර පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් ගස් 12235ක් සඳහා ප්‍රතිකාර කර ඇත.දිස්ත්‍රික්ය තුල මේ වන විට බ්‍රොන්ටිස්පා හානිය සළකුණු කළ ගස් 659ක් වන අතර මොනක්‍රොටපොස් එන්නත් කළ ගස් ගණන 659ක් වේ. | දිස්ත්‍රික් නිලධාරී පොල් සංවර්ධන මණ්ඩලය |
| | | තැඹිලි ගම්මාන පිහිටුවීම | තැඹිලි ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්යේ මුරුතවෙල ග්‍රාමය තෝරා ගෙන ඇත. එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට තැඹිලි පැල 300ක් බෙදා දි ඇත.<br>හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සුදු මැස්සාගේ හානිය ව්‍යාප්ත වෙමින් පවතින අතර මේ වනවිට ගස් 41349ක හානිය හඳුනාගෙන ඇති අතර පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් ගස් 12235ක් සඳහා ප්‍රතිකාර කර ඇත.මීට අමතරව 2023 වර්ෂයේ අවසන් මාස කිහිපය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ බ්‍රොන්ටිස්පා හානි වූ ගස් 653ක් හඳුනා ගස් අතර, එම ගස් 659ටම මොනක්‍රොටපොස් මණ්ඩලය මඟින් එන්නත් කර ඇත.<br>මේ වනවිට පවතින අධික වියළි කාලගුණයත් සමඟ පොල් වගාවේ තෙතමනය ආරක්ෂා කර ගැනිම සඳහා වසුන් යෙදිම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බවත්, මේ සඳහා ඉදිරියේදි සහනාධාර මුදලක් ලබා දිමට කටයුතු කරන බවත් සඳහන්කරන ලදි. | |
| 17. | කජු වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකා කජු සංස්ථාවේ හම්බන්තොට බල ප්‍රදේශයේ 2023 ඉලක්ක අක්කර ප්‍රමාණය 125කි. පසුගිය මාස වල | |

| | | | | |
|---|---|---|---|---|
| | | | පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් පැළ ලබාදීම ප්‍රමාදවීම නිසා ජනවාරි,පෙබරවාරි මාස වලදී පැළ ලබා දීමට සිදුවිය. අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පැළ 1190ක්, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පැළ 210ක්, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසට පැළ 875ක්, හම්බන්තොට ලබා දුන් පැළ සංඛ්‍යාව පැළ 70කි. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පැළ 1050කි. ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පැළ 735කි. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසටය පැළ 385කි. මීට අමතරව තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩසටහන සඳහා බද්ධපැළ 1270ක් ලබා දී ඇත බීජ පැළ1140ක් නිකුත්කර ඇත. අපනයන කෘෂි ගම්මාන වැඩසටහන සඳහා පැළ 3404 ක් නිකුත්කර ඇත. අම්බලන්තොට ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව සඳහා හැකි සෑම අවස්ථාවකදීම සහභාගී වීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | සහකාර ප්‍රාදේශීය කළමනාකරු, ශ්‍රී ලංකා කජු සංස්ථාව |
| 18. | රබර් වගාව | ප්‍රගතිය | 2024 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයට නව රබර් වගා ඉලක්කය හෙක්ටයාර 16කි. පැළ 9040ක් නිෂ්පාදන කර ඇත.අතුරු බෝග වගාව හෙක්ටයාර 13කි. 2024 වර්ෂයේ අස්වනු ස්වායක පුහුනු වැඩසටහන් 03ක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවද සඳහන් කරන ලදී. බද්ධකරුවන් පුහුනු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවද සඳහන් කරන ලදී. | |
| 19. | සත්ත්ව පාලනය හා තෘණ භූමි | ප්‍රගතිය | සත්ත්ව අභිජනන කටයුතු ලෙස කෘත්‍රිම සිංචන කටයුතු එළ ගව, මී ගව, එළු වශයෙන් 174ක්, කෘත්‍රිම සිංචන ගැබ් පරික්ෂා කිරීම් 105ක්, කෘත්‍රිම සිංචන උපත් ලියාපදිංචිය 80ක් සිදු කර ඇත. තෘණ වගාව (පර්ච්) 365ක වගා කටයුතු සිදු කර ඇත.එන්නත් කිරීම් ලෙස ජලභීතිකා එන්නත් 454ක් සිදු කර ඇත.සත්ත්ව සෞඛ්‍යය යටතේ සුරතල් සතුන්ට ඩිස්පෙන්සරි ප්‍රතිකාර 606ක්, කෘසිකාර්මික සතුන් සඳහා 886ක් සිදු කර ඇත.කෘත්‍රිම සිංචනයෙන් ලැබෙන වැස්සි පැටවුන් සඳහා පැටවු ආහාර ලබාදීම් 06ක් සිදු කර ඇත. පළාත් නිශ්චිත සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන තිබුණත්, මේ වනතෙක් ප්‍රතිපාදන අනුමත වී නොමැත. උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති යටතේ සෞඛ්‍ය ආරක්ෂිත කට්ටල 300ක්,ගොවි සමුළු 12ක්, පශු වෛද්‍ය කොට්ඨාස 12 ආවරණය වන පරිදි සිදු කිරීමට කටයුතු යොදා ඇත.කැකණදුර සත්ත්ව පාලන පුහුනු මධ්‍යස්ථානයෙන් ගොවි පුහුණු 10ක් සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇත.<br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවට අදාළව බිම් මට්ටමින් ගොවි ජනතාව නිසියාකාරව දැනුවත්කිරීමට නිසි ක්‍රමවේදයක් හා ප්‍රමාණවත් තරම් නිළධාරීන් නොසිටීම ප්‍රායෝගිකව ගැටළුවක් බව දැනුම් දුන් අතර මේ සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ දැනුවත් කිරීමට යෝජනා විය.<br>හම්බන්තොට දිස්ත්‍රික්කයේ දරුවන්ගේ පෝෂණ තත්ත්වයේ ගැටළුවක් පවතින බව මාධ්‍ය විසින් වාර්තා කර තිබූ බවත්, දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්මය හා සත්ත්ව නිෂ්පාදන අංශයන්ගේ සහය අවශ්‍ය බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට. |
| 20. | කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | ප්‍රගතිය | 2023/24 මහ කන්නයේ දැනට වාර්තා වී ඇති වගා හානි වූ ගොවීන් 3530ක් හා අක්කර 5718ක් වාර්තා වී ඇත. මේ අතුරින් බොහෝමයක් පළමු අවදියේ හා දෙවන අවදියේ හානි ලෙස වාර්තා වී ඇත.මීට අමතරව 2023 යල කන්නයේ වගා හානි ගණනය නොවැම්බර් 9 වන දින ආරම්භ කරන ලදී. මේ වන විට ගොවීන් 1300කගේ පමණ තොරතුරු කොළඹ ප්‍රධාන කාර්යාලය වෙත යොමු | සහකාර අධ්‍යක්ෂ කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |

| | | | | |
|---|---|---|---|---|
| | | | කර ඇත.වගා හානි දැනුම් දීමේ කාලය දින 14 සිට දින 45 දක්වා පසුගිය යල කන්නයට පමණක් වන පරිදි සංශෝධනය කරගත් බව දැනුම් දෙන ලදී. ඒ අනුව තවත් ගොවින් පිරිසක් සඳහා වන්දි මුදල් ලබා දිය හැකි බව දැනුම් දෙන ලදී. මුදල් ගෙවා රක්ෂණය වන ගොවීන්ගේ කන්න දෙකක් තුල වගා හානි සඳහා වන්දි ලබාගෙන නොමැතිනම් ඉදිරි රක්ෂණ වාරිකයෙන් 15%ක වට්ටමක් ලබා දීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. වන අලි හානි හේතුවෙන් ගොවින් 30 දෙනෙකුගේ අක්කර 51ක් හානි වී ඇති බව දැනුම් දෙන ලදී. වන අලින්ගෙන් වන හානි වලදී ,තක්සේරු කමිටුව සඳහා වනජීවී නිලධාරීවරයෙකු සම්බන්ධ විය යුතු බව දැනුම් දෙන ලදී. | |
| 21. | ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය | ප්‍රගතිය | පසුගිය වසරේ හදබිම අධිකාරියේ ක්‍රියාකාරකම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 9ක පමණක් ක්‍රියාත්මක වුවත් මෙම වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12ම ක්‍රියාත්මක වන බව දැනුම් දෙන ලදී. මේ වන විට වසම් තෝරා ගැනීම සිදු කර අදාළ ගැමි සහභාගීත්ව ප්‍රවේශයන් (PRA) සිදුකර ඇති බව දැනුම් දෙන ලදී. මේ වන විට වසම් 35ක් තෝරාගෙන ඇති බව දැනුම් දෙන ලදී. මේ යටතේ කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන්, ගෙවතු වගා වැඩසටහන්, කුකුළු පාලන වැඩ සටහන, 50% සහනාධාර යටතේ වායු රයිෆල් ලබා දීම, 50% සහනාධාර යටතේ මී මැසි පාලනය සඳහා උපකරණ ලබා දීම, අතිරේක ආහාර බෝග හා බීජමල් නිෂ්පාදනය සඳහා ආදාර ලබා දීම, 50% සහනාධාරය යටතේ මස් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන දිනක් වයස කුකුළු පැටවුන් උපරිම 100 දෙනෙකුට යටත්ව ලබා දීමට කටයුතු යොදා ඇත. 2023 වර්ෂයේ පළතුරු ගම්මාන ලෙස වැල්දොඩම් ගම්මාන ඇති කරන ලද අතර, 2024 වර්ෂයේ වලස්මුල්ල ප්‍රදේශයේ දූරියන් ගම්මානයක් ඇති කිරිමට යෝජනා වී ඇත. 2023 වර්ෂයේ කුකුළු පැටවුන් 1090ක් බෙදා දී ඇත. මේ වන විට ඉන් යම් ප්‍රමාණයක් බිත්තර දැමීම සිදුකරන බව දැනුම් දෙන ලදී. මේ වන විට බිත්තර රක්කවීමේ යන්ත්‍ර (Incubator) සාදාගෙන කටයුතු කරන ගොවින් පිරිසක් සිටින අතර අදාළ නාමලේඛන ලබා දීමේ හැකියාව පවතින බව දැනුම් දෙන ලදී.මේ සියලුම වැඩසටහන් ආර්ථික සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම උපදේශක වරුන් හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහාකරවරුන් සම්බන්ධකර ගනිමින් සිදුකරන බව දැනුම් දෙන ලදී. බිත්තර රක්කවීමේ යන්ත්‍ර (Incubator) තමන් විසින් නිෂ්පාදනය කරන ගොවි ප්‍රජාවක් සිටින බව ගොවි නියෝජිතයින් විසින් දැනුම් දුන් අතර එම බිත්තර රක්කවීමේ යන්ත්‍ර නිෂ්පාදනකරුවන් දිරි ගැන්වීමේ නිසි ක්‍රමවේදයක් සැකසිය යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුවත් කරනලදි. | දිස්ත්‍රික් නිලධාරී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය |
| 22. | පසු අස්වනු තාක්ෂණ ආයතනය | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත | |
| 23. | වියලි කලාපීය උද්භිත උද්‍යානයේ වැඩ සටහන් | ප්‍රගතිය ඉදිරිපත් තිරීස | ප්‍රධාන වශයෙන් පැළ වර්ග නිෂ්පාදන කරනු ලබන අතර මෙම පැළ මිල දී ගත හැකි බව දැනුම් දෙන ලදී. සුවහස් මල් සමිති 12ක් පවත්වාගෙන යනු ලබයි. වගාකරුවන්ගේ ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදු කර අවශ්‍ය උපදෙස් ලබා දිම සිදු කරනු ලබයි.මෙම වසරේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත.2023 වර්ෂයේ වෙන් වු මුදල් මඟින්, සුවහස් මල් සමිති වල ලියාපදිංචි සාමාජිකයින්හට සෙවනදැල්, UV ප්‍රතිකාර කරන ලද පොලිතින් සහ පොලිතින් බෑග් ලබාදිම මේ වසරේ සිදු කළ හැකි බව සඳහන් කරන ලදි. ගොවිජනසේවා මධ්‍යස්ථානයකට එක් සමිතියක් බැගින් සමිති 12ක් ආරම්භ කර ඇති බව සඳහන් කරන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වියලි කලාපීය උද්භිත උද්‍යානය, මිරිජ්ජවිල. |

| | | | | |
|---|---|---|---|---|
| 24. | තල් සංවර්ධන මණ්ඩලය | ප්‍රගතිය | බටඅත කෘෂි තාක්ෂණික ප්‍රදර්ශනය සඳහා සම්බන්දවීමට අවශ්‍ය සහාය ලබා දුන් සියලු ආයතන වෙත ස්තුතිය පල කරන ලදී. දකුණු පළාත සඳහා තල් ආශ්‍රිත නිෂ්පාදන රාශියක් හඳුන්වා දුන් බවත්, අලුතෙන් සිටුවන ලද තල් බීජ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් නිලධාරි තල් සංවර්ධන මණ්ඩලය (වීරවිල) |
| 25. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (වීරවිල/ රිදියගම) | වීරවිල ගොවිපල<br>රිදියගම ගොවිපල | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත.<br>දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | ගොවිපල කළමණාකරු ( වීරවිල) ගොවිපල කළමණාකරු ( රිදියගම) |
| 26. | 26.1 ධීවර කටයුතු ශ්‍රී ලංකා ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය (මිරිදිය ධීවර කටයුතු) | නිත්‍ය/ කාලීන ජලාශ/පොකුණු තුල මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම | විශාල ජලාශ 2ක් තුල මත්ස්‍ය ඇඟිල්ලන් ඉලක්කය 1,984,100කි.ප්‍රගතිය මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 100,000කි. මධ්‍ය ජලාශ 6ක් තුල ඇඟිල්ලන් ඉලක්කය 2,543,000කි. ප්‍රගතිය මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 60,000කි. කුඩා ජලාශ 65කි ඉලක්කය 5,342,250කි. ප්‍රගතිය මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 380,770කි. කාලීන ජලාශ 332කි. ඉලක්කය 170,920කි. තැන්පත් කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 51,150කි. | දිස්ත්‍රික් නිලධාරි, ශ්‍රීලංකා ජලජීවී සංවර්ධන අධිකාරිය |
| | | මිරිදිය ඉස්සන් තැන්පත් කිරීම | විශාල ජලාශ 2ක් තුල 1,792,000කි. ප්‍රගතිය 348,473කි. කුඩා ජලාශ 65ක් තුල ඉස්සන් ඉලක්කය 2,205,000කි,මධ්‍යම ජලාශ 6ක් තුල 11,167,000කි. ප්‍රගතිය මිරිදිය ඉස්සන් 335,307කි. | සියලුම ප්‍රාදේශීය ලේකම් වරුන් |
| | | මත්ස්‍ය අස්වැන්න | 2024 පෙබරවාරි 29 දක්වා නිත්‍ය කාලීන ජලශ පොකුණු /ගංගා තුල් සමුච්චිත ප්‍රගතිය මෙටො.447.26 | |
| | | ධිවර කළමණාකරණ දත්ත | මෙහෙයුම් කළමනාකරණ බලපත්‍ර ලබා දීම 83කි. ජලජීවී වගා කළමණාකරණ බලපත්‍ර ලබා දීම 05කි, යාත්‍රා ලියා පදිංචි කිරීම 178කි. වැටලීම් කටයුතු 04 කි. | |
| | | මත්ස්‍ය මිල ගණන් | තිලාපියා කිලෝවක තොග මිල රු.450.00-500.00කි. සිල්ලර 700.00- 750.00කි. කාපයා තොග මිල කිලෝවක් 350.00-450.00කි. සිල්ලර රු.700.00-750.00කි. මිරිදය ඉස්සන් තොග මිල කිලෝවක් රු.1800.00-2000.00කි. සිල්ලර මිල රු.2500.00 සිට 2700.00 දක්වා වේ. | |
| | | ජලාශයන් හි ස්ථාපිත දැල් කුඩු තුල ඇසිත්තන් තැන්පත් කිරීම | ජලාශයන් 2ක දැල් කුඩු 4ක ඇසිත්තන් 105,000ක් තැන්පත් කරන ලදී. | |
| | | | ගෘහාශ්‍රිතව මිරිදිය මත්ස්‍ය වගාව සඳහා ගොවි සංවිධාන හා ව්‍යාපාර කමිටු හරහා ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | |
| | 26.2. කරදිය ධීවර කටයුතු | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | සහකාර අධ්‍යක්ෂ ධීවර දෙපාර්තමේන්තුව |
| 27. | වනජීවී කටයුතු | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | වන අලින් පළවා හැරීම සහ වන අලින් ගැවසෙන ස්ථාන වල සැරිසැරීම සම්බන්දයෙන් කැලියපුර හා සූරියවැව ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම එම මාර්ග දෙකක් ශමදාන මගින් එළි පෙහෙළි කිරීම සිදු කරන ලදී. අලි වෙඩි බෙදාදීම මේ වන විට සිදු වන බව දැනුම් දෙන ලදී. අධිවේගී මාර්ගයේ ඉදිකිර ඇති බෝක්කු සම්බන්ධයෙන් වන ගැටළු තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටුව වෙත යොමු කිරීමට තීරණය විය. වල්සපුගල පදේශයේ විවෘත කරන ලද අලිවැට කොටසෙහි යම් අඩුපාඩුවත් පවතින බව දැනුවත් කළ අතර අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කර කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස අතිරේක දිස්ත්‍රික් ලේකම් | සහකාර අධ්‍යක්ෂ, වනජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව |

| | | | | |
|---|---|---|---|---|
| | | | (ඉඩම්) විසින් දැනුම් දෙන ලදි. | |
| 28. | වන සංරක්ෂණ කටයුතු | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන වනරක්ෂිත තුල වැව් ප්‍රතිසංස්කරණය කිරිමේදි ඉවත් කරනු ලබන ශාක වෙනුවට නැවත අළුතින් ශාක සිටුවීමට අදාළ කටයුතු සිදු කරන මෙන් සඳහනක් කරන ලදි. මෙම වර්ෂයේ වන පැළ සිටුවීමේ ව්‍යාපෘති සඳහා විවිධ ආයතන වෙත පැළ අවශ්‍ය වේනම් ඉල්ලීම් සිදුකරන ලෙස දැනුම් දෙන ලදී.උත්සවසමය උදා වන බැවින් පාරම්පරික මැටි කර්මාන්තය සඳහා මැටි ලබාගැනීමට අදාළ කණ්ඩායම් වෙත අවස්ථාව සළසා දෙන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. අදාළ කණ්ඩායමක් විසින්, වන සංරක්ෂණ ජනරාල්වරයගෙන් ඉල්ලිමක් සිදු කළ යුතු බවත්, ඒ සඳහා අවශ්‍ය කළමණාකරණ සැලසුම අනුමත වී ඇති බැවින් ගැටළුවක් නොවන බවත් සඳහන් කරන ලදි. | දිසා වන නිලධාරි හම්බන්තොට |
| 29. | රාජ්‍ය දැව සංස්ථාව | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| 30. | ඉඩම්කටයුතු<br>30.1 ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම හා ඉඩම් කටයුතු (පළාත්) | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| | 30.2 ඉඩම් දීමනා පත්‍ර බලපත්‍ර නිකුත් කිරීම, ඉඩම් කටයුතු (අපවා) | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| | 30.3 ඉඩම් පරිහරණ සැලසුම් | ප්‍රගතිය | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම යාවත්කාලීන කිරීම දත්ත භුවමාරුව සහ ඉඩම් පරිහරණ සැළසුම් කරණය ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය හා භුමි පරිහරණ වෙනස්කම් හදුනාගැනීමේ සමීක්ෂණය සිදු කෙරෙන ඉලක්ක ගත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12කි. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය යටතේ දත්ත පද්ධතිය සකසා ප්‍රධාන කාර්යාලය වෙත භාරදී ඇත. භූමි පරිහරණ වෙනස්කම් හදුනාගැනීමේ සමීක්ෂණය සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී. පස හා ජල සංරක්ෂණය තුලින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම් වල ඵලදායිතාවය ඉහල නැන්වීමේ ඉලක්කය බෙලිඅත්ත ගැටමාන්න දකුණ, කටුවන මැදකන්ද හා වලස්මුල්ල කැබැල්ලකැටිය වේ. මේ මස ප්‍රගතිය 2.5%කි. ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුමේ සකස් කිරිම යටතේ හම්බන්තොට එලල්ල, ඕකෙවෙල කණුමුල්දෙනිය දකුණ, තංගල්ල පට්ටියපොළ දකුණ, තිස්සමහාරාමය- බබැබඹ එල්ලංගා පද්ධතිය හා වීරකැටිය රළුව සීතාවක දෙණිය එල්ලංගා පද්ධතිය පසුගිය මස දක්වා ප්‍රගතිය 15%කි. සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදුකරණු ලබන විශේෂ අධ්‍යන. සූරියවැව දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව නිසා සිදුව ඇති ඉඩම් පරිහරණ වෙනස්කම් සහ සමාජ ආර්ථක බලපෑම අධ්‍යනය කිරීම මේ මස ප්‍රගතිය 2%කි. විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැළසුම් කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම අම්බලන්තොට වීරකැටිය, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම ඉලක්කය 4කි ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළැසුම් කමිටු පැවැත්වීම ඉලක්කය 17කි. මේ මස ප්‍රගතිය 5කි (අම්බලන්තොට, ලුණුගම්වෙහෙර,සූරියවැව, තංගල්ල, වීරකැටිය) | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) |
| 31. | ජාතික තරුණ සේවා සභාවේ කටයුතු | ප්‍රගතිය | කුඹුරු අක්කර 9ක් පමණ වගා කර ඇති අතර තව දින දෙකකින් පමණ අස්වනු නෙලීම ආරම්භ කිරීමට නියමිතය. 2023 දෙසැම්බර් මස බිත්තර දමන කිකිලි | දිස්ත්‍රික් නිලධාරී, ජාතික තරුණ සේවා සභාව, |

| | | | | |
|---|---|---|---|---|
| | | | පැටවුන් 2500ක් පමණ ගොවිපල වෙත ගෙන ආ අතර මේ මස අවසන් වන විට බිත්තර අස්වැන්න බලාපොරොත්තු වන බව දැනුම් දෙන ලදී. සීනිකෙසෙල් අක්කර 2ක පමණ වගා කොට ඇත. වැල්දොඩම් පැළ 800ක් වගා කැර ඇත.අඹ පැළ 400ක් සිටුවා ඇත. මහවැලි ජලයෙන් සහ අහස් දියෙන් ජලය රදවා ගන්නා අක්කර 2ක වපසරියක් ඇති වැවක් පවතින බවත් මේ දින වල එලවලු වගාව ද ආරම්භ කර ඇති බවත් දැනුම් දෙන ලදී. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව පැළ තවාන් පාඨමාලාව සහ කෘෂි ක්ෂේත්‍ර සහායක පාඨමාලාව පවත්වන බව දැනුම් දෙන ලදී. මෙම පාඨමාලා වලට අමතරව වැඩිදුර පුහුණුව සිදුකරන සිසුන් 9 දෙනෙකු සිටින අතර එම සිසුන් මගින් මෙම ගොවිපලේ සංවර්ධන කටයුතු කටයුතු සිදුකරන බව දැනුම් දෙන ලදී. | එරමිණියාය. |
| 32. | මධ්‍යම පරිසර අධිකාරිය | | විශේෂ ගැටළු කිසිවක් වාර්තා නොවීය | දිස්ත්‍රික් පරිසර නිළදාරී |
| 33. | පාරිභෝගික අධිකාරිය | | පාරිභෝගක අධිකාරිය මගින් කෘෂි රාසායන ද්‍රව්‍ය සම්බන්දයෙන් උපරිම සිල්ලර මිලක් ලකුණු කර නොමැති බවත්, කාණ්ඩ අංක සටහන් කර නොතිබීම, අනිවාර්ය මිලක් සඳහන් කර නොතිබීම,ප්‍රමාණය, බර,නිෂ්පාදිත දිනය හා කල් ඉකුත් වන දිනය සඳහන් කර නොතිබීම මත නීතිය ක්‍රියාත්මක කළ හැකි බව දැනුම් දෙන ලදී. මිල සහ තොරතුරු වෙනස් කිරීම හා කපා හැරීම හා ලකුණ කළ මිලට වඩා මිලකට අලෙවි කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කළ හැකි බවත් දැනුම් දෙන ලදී. මේ වසරේ දැනට වෙළඳ සැල් 6ක් සම්බන්දව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බව දැනුම් දෙන ලදී. කිරුම් මිනුම් හා ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හා පාරිභෝගික සේවා අධිකාරිය සමග ඒකාබද්ධව වැටලීම් කටයුතු සිදු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ, පාරිභෝගික සේවා අධිකාරිය |
| 34. | වෙනත් ගැටළු හා යෝජනා | අරන්වල අහුල්මඩුව පාලම | අරන්වල අහුල්මඩුව පාලම ආසන්නයේ පවතින යකඩ කණු අක්කර 15ක පමණ කුඹුරු යායක් විනාශ වන පරිදි දමා තිබීම හේතුවෙන් ගොවින් දැඩි දුෂ්කරතායකට පත් වී ඇති බව සඳහන් කරන ලදී. මාර්ග සංවර්ධන අධිකාරිය වෙත අදාළ වගකිම පැවරී තිබුණද තවමත් ඒ සඳහා විසඳුම් ලබා නොදුන් බවද සඳහන් කරන ලදී. මේ සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකදිම සාකච්ජා කළ බවත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වැඩිදුරටත් දැනුවත් කිරිම සිදු කළ යුතු බවත් ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, විරකැටිය විසින් දැනුම් දෙන ලදී. | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, විරකැටිය. |
| | | ගව හානි සම්බන්ධව | නිදැල්ලේ හැසිරෙමින් වගා හානි සිදු කරන ගවයන්ගේ ඡායාරූපයක් ලබාගෙන අදාළ ආයතන වෙත යොමු කිරිමෙන් අදාළ වගා හානිය ලබා ගැනිමට හැකි වන පරිදි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පනත සංශෝධනය කර දෙන ලෙස ඉල්ලිමක් ඉදිරිපත් විය.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශිය සභා වලින්ද ගවයන් අයාලේයාම සම්බන්ධයෙන් නිති ක්‍රියාත්මක වන බව සඳහන් කරන ලදී.ගොවිජන සංවර්ධන අධකක්ෂ ජනරාල් වෙත අදාළ ගැටළුව යොමු කිරිමට කටයුතු කරන බව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් දැනුම් දෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| | | රතු කැකුළු සහල් නිෂ්පාදනය | දකුණු පළාතේ බහුලවම රතු කැකුළු සහල් පරිභෝජනය ඉහළ මට්ටමක පවතින අතර රතු කැකුළු වී නිෂ්පාදනයද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉහළ මට්ටමක පවති. නමුත් ශ්‍රී ලංකාවේ වෙනත් පදේශ වලද ඉතා විශාල වශයෙන් මේ වනවිට රතුකැකුළු වී නිෂ්පාදනය සිදු කිරිම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවින්හට සිදු කරනු ලබන අසාධාරණයක් වන බැවින්, අනෙකුත් පදේශවල ගොවින් වෙනත් වී | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ |

| | | | | |
|---|---|---|---|---|
| | | | වර්ග වගා කිරිමට යොමු කරන ලෙස ගොවින් විසින් යෝජනා කරන ලදි. | |
| 35. | ලිපි ඉදිරිපත් කිරීම | මහවැලි ව්‍යාපාරය මගින් මුදාහරින අපවහන ජලය කඩවරවැවට එක් කිරීම | <u>මහවැලි ව්‍යාපාරය මගින් මුදාහරින අපවහන ජලය කඩවර වැවට එක් කිරීම නිසා රිදියගම ව්‍යාපාරයේ ගොවිබිම් ගණනාවක කුඹුරුවලට වූ හානියෙන් පීඩාවට පත් ගොවින්ට සහනයක් ලබා ගැනීම සම්බන්ධවයි.</u><br>මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක්ම ගොවි ප්‍රජාව හා මහවැලි අධිකාරිය සමඟ සිදු කෙරුණු අතර නිරීක්ෂණ කටයුතුද සිදු කළ බව හම්බන්තොට පාදේශිය වාරිමාර්ග ඉංජිනේරු විසින් දැනුම් දෙන ලදි. කිලෝමීටර් 07ක් පමණ වන කොග්ගල්ආර බස්නාව ප්‍රථමයෙන් සුද්ද කළ යුතු අතර මිලියන 50ක පමණ මුදලක් අවශ්‍ය බවත්, මුදල් ප්‍රතිපාදන ලැබේ නම් එම කටයුතු සිදු කළ හැකි බව සඳහන් කරන ලදි.<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණික සේවා අංශය මගින් ප්‍රධාන කාර්යාලය දැනුවත් කිරීමේ කටයුතු සිදු කර ඇත. මේ සම්බන්ධවෙන් වනජීවී හා වාරිමාර්ග අමාත්‍යතුමියද දැනුවත් කළ බවත්, අමාත්‍යතුමිය අදාළ ක්ෂේත්‍රය පරික්ෂා කිරීම් කටයුතු සිදු කිරිමට නියමිත බවද නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු(කෘෂිකර්ම) විසින් සඳහන් කරන ලදි. මේ වනතෙක් අවශ්‍ය ප්‍රතිපාදන හෝ උපදෙස් නොලැබුණු බවද සඳහන් කරන ලදි. මේ සඳහා අවශ්‍ය මුදල් ඇස්තමේන්තුවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා මහවැලි අධිකාරිය වෙත මේ වනවිටත් ලබා දී ඇති බවත්, සියළු ආයතන සමඟ සම්බන්ධිකරණයෙන් මෙම ගැටළුව නිරාකරණය කර ගත යුතු බව හම්බන්තොට පාදේශිය වාරිමාර්ග ඉංජිනේරු විසින් සඳහන් කරන ලදි. 2024.03.28 වන දින පැවැත්වීමට නියමිත දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව සඳහා මෙම ගැටළුව තවදුරටත් සාකච්ඡා කිරිමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුවේදී ලබා ගන්නා තිරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට හා වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාල වෙත යොමු කිරිමට කටයුතු කරන මෙන්ද වැඩිදුරටත් දැනුම් දෙන ලදි.<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත්, එහිදි මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනිමට නියමිත බවත්, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු ( තාක්ෂණික අංශය) මහවැලි අධිකාරිය විසින් සඳහන් කරන ලදි. | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට.<br><br>නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු (කෘෂිකර්ම), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| | | බටඅත බීජ ගොවිපල වගා ක්ෂේත්‍ර හා කාර්යාල කොටස නිතර ජලයෙන් යටවීම | <u>බටඅත බීජ ගොවිපල වගා ක්ෂේත්‍ර හා කාර්යාල කොටස නිතර ජලයෙන් යටවීම සම්බන්ධවයි</u><br>නි.කෘ.අ./බ/01/47 දරන ලිපි අංක හා 2024.01.03 වන දින දිස්ත්‍රික් ලේකම් වෙත පිටපතක් සහිතව එවන ලද ලිපිය හා බැඳේ.<br>01.රොඩිමැලේ ඇලේ පිරිසිදු කිරීම් කටයුතු මේ වනවිට සිදු කළ බවත්, අනවසර ඉදිරිකිරීම් ඉවත් කළ බවත් සඳහන් කරන ලදි.එහි තවත් එක් ඉදිකිරීම් කටයුත්තක් ඉවත් කිරිමට මේ වනවිට කටයුතු කරගෙන යන බවද හම්බන්තොට ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු සඳහන් කරන ලදි.<br><br>2. ගොවිපල තුළ පවතින ඇළමාර්ග වල ගැඹුර වැඩිබවද, තාක්ෂණිකව කරුනු සොයා බැලීමෙන් අනතුරුව ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි වැඩකටයුතු සිදු කරන බව හම්බන්තොට ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු සඳහන් කරන ලදි. | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට.<br><br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), බටඅත |

| | | | | |
|---|---|---|---|---|
| | | කම්මැන්නාව යාය සඳහා කුඹුරු වලට ජලය ලබා ගැනිම | **<u>කුඹුරු වලට ජලය ලබා ගැනිම සඳහා</u>**<br>පුබුදු ගොවි සංවිධානය මගින් 2024.02.19 දින දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර ඇති ලිපිය හා බැඳේ.<br>අවශ්‍ය කරුනු සොයා බලා වාර්තා කරන බව තිස්සමහාරාම ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු විසින් දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, තිස්සමහාරාමය |
| | | කොච්චිපතාන වැව් ඉස්මත්තේ ලෙපර්ඩ් ට්‍රේල් නමින් පවත්වා ගෙන වන සංචාරක හෝටලය. | **<u>කොච්චිපතාන වැව් ඉස්මත්තේ ලෙපර්ඩ් ට්‍රේල් නමින් පවත්වා ගෙන වන සංචාරක හෝටලය සම්බන්ධවයි.</u>**<br>මෙම ප්‍රශ්නයට අදාළව නඩුවක් ගොනු කිරිම සඳහා අවශ්‍ය ලිපි ගොනු මේ වනවිටත් සකසා අවසන් බවත්, ඒකාබද්ධ පරික්ෂණයේ නිර්දේශ ලැබෙනතෙක් එම කටයුතු ප්‍රමාද කරන ලෙස කොමසාරිස් ජනරාල් උපදෙස් ලබාදුන් බව ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් දැනුම් දෙන ලදි. මොනරාගල කාර්යාලයත් සමඟ සාකච්ඡා කර ඉදිරි කඩිනම් විසඳුමකට යායුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| | | විදුලි වැටෙහි උපකරණ ගලවා සොරකම් කිරිම | **<u>අලි මිනිස් ගැටුමට විකල්පයක් ලෙස භාවිතා කළ විදුලි වැටෙහි උපකරණ ගලවා සොරකම් කිරිම සම්බන්ධවයි.</u>**<br>බුන්දල ගම්වාසින් විසින් 2024.01.08 දින දිස්ත්‍රික් ලේකම් වෙත පිටපතක් සහිතව එවන ලද ලිපිය හා බැඳේ.<br>කරුණු සොයා බලා වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ, වනජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව |
| | | | **<u>ප්‍රාදේශිය කෘෂිකර්ම කමිටු තිරණ දැනුම් දිම - තිස්සමහාරාමය</u>**<br>සහකාර පාදේශිය ලේකම්ගේ DSTI/PLN/12/AGRI/01/COMT-2024 හා 2024.02.13 දිනැති ලිපිය හා බැඳේ.<br>කෘමිනාශක හා වල්නාශක වල ප්‍රමිතිය පාලනයකින් තොර විම හා මිල පාලනයක් නොමැති විම නිසා ගොවින් දැඩි දුෂ්කරතාවයකට පති වී ඇති බව දැනුම් දෙන ලදි. තාක්ෂනික දැනුමක් සහිතව බිම් මට්ටමේ යාන්ත්‍රණයක් සැකසිම සුදුසු බවට කරුනු ඉදිරිපත් විය. | ප්‍රාදේශිය ලේකම්, තිස්සමහාරාමය |
| | | පවේණියය සඳහා සහනයක් ලබා ගැනිම | **<u>පවේණිය සඳහා සහනයක් ලබා ගැනිම</u>**<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා එම තිරණය ලබා ගත යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |

එස්. කේ. එස්. රුබසිංහ
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වැ.බ)
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
හම්බන්තොට.

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

ලේකම් | සභාපති
---|---
එස්.කේ.එස්.රුබසිංහ<br>දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වැ/බ)<br>හම්බන්තොට. | එච්.පී.සුමණසේකර<br>දිස්ත්‍රික් ලේකම්/දිසාපති<br>හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

2024 අප්‍රේල් මස ..... වැනි දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.